# How To Scale Your Business

## Chapter 19

**අයවැය කළමණාකරනය කරමින් Budget එක ගොඩනගන හැටි**



Trainer: Fathhi Mohamed

# 1. The Need for Forecast and Budget

Budget යනු ව්‍යාපාරයට දිශාව ලබා දෙන මාර්ග සිතියම බඳුය.

- **වර්ධනය පාලනය කිරීම:** ව්‍යාපාරයක් වර්ධනය වන විට ආදායම සහ වියදම් යන දෙකම කළමනාකරණය කිරීම දුෂ්කර වේ. නිවැරදි Focus එකක් නොමැති නම්, වියදම් පාලනයෙන් තොරව ඉහළ යා හැකිය.
- **Actionable Insight:** Budget මඟින් ඔබගේ ඉලක්ක මත පදනම්ව ක්‍රියාවට නැංවිය යුතු දේ තීරණය කිරීමට උපකාරී වේ.
    - **උදාහරණය:** "මාසය අවසානයේ ලක්ෂ 120 ක් උපයන්නට නම්, ලක්ෂ 20 ක අමතර ආදායමක් සඳහා මා කුමක් කළ යුතුද?" යන ප්‍රශ්නයට පිළිතුරු සෙවිය හැක.
- අවම වශයෙන් මාස 3 ක Forecast එකක් තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. වසර 1, 3, හෝ 5 ක දීර්ඝ කාලීන Forecast තිබීම වඩාත් යෝග්‍ය වේ.




# 2. The Continuous Review Cycle

අයවැය යනු වරක් සාදා අවුරුද්දකින් බලන ලේඛනයක් නොවිය යුතුය.

- සකස් කළ Forecast සහ මාසය අවසානයේ ඇති Actual Data නිරන්තරයෙන් සංසන්දනය කරන්න.
- Forecast එකේ දෝෂ තිබේ නම්, එය නිවැරදි කරන්න. ව්‍යාපාරයේ දෝෂ තිබේ නම්, වහාම ක්‍රියාමාර්ග ගෙන එය නිවැරදි කරන්න.
- මාස කිහිපයක් මෙසේ කිරීමෙන් පසු, ඔබේ වැය ඇස්තමේන්තුව යථාර්ථයට සමීප වන අතර, එමඟින් ව්‍යාපාරය Scale කිරීම පහසු වේ.

## 3. ඉතුරුම් නැවත ආයෝජනය කිරීම (Reinvesting Savings)

සමාගම උපයන ලාභය කළමනාකරණය කරන්නේ කෙසේද යන්න අයවැයකරණයෙන් තීරණය වේ.

- **ලාභ කළමනාකරණය:** සකස් කළ අයවැයෙන් ඉතිරි වන මුදල් සඳහා කළ යුත්තේ කුමක්ද? එය කොටස්කරුවන් අතර බෙදීම (Dividend Declaration) හෝ ව්‍යාපාරය තවදුරටත් වර්ධනය සඳහා නැවත යෙදවීම කළ හැකිය.
- **වර්ධන ආයෝජන:** ලාභය භාවිතා කරමින්, ඔබගේ වර්ධන ඉලක්ක (උදා: ඊළඟ කාර්තුවට RS.**10,00,000** ක අමතර ආදායමක්) සපුරා ගැනීමට අවශ්‍ය සේවකයින් හෝ ක්‍රමවේද සඳහා ආයෝජනය කරන්න.
- **"Pay Yourself First" වෙනුවට "Pay the Growth First":** වර්ධන සැලැස්මක් තිබේ නම්, ප්‍රාග්ධනයෙන් කොටසක් එම වර්ධන ඉලක්කය සඳහා ආයෝජනය කළ යුතුය.



## 4. වියදම් විශ්ලේෂණය (Expense Analysis Exercise)

Scale කිරීමට පෙර වියදම්වල කාර්යක්ෂමතාව තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ.

- **Top Five Expenses හඳුනා ගැනීම:** ඔබේ ව්‍යාපාරයේ මාසික ඉහළම වියදම් පහ ලැයිස්තුගත කරන්න.
  - උදා: විදුලිය, අලෙවිකරණය, කුලී, උප කොන්ත්‍රාත් ගාස්තු, ප්‍රවාහනය.
- **Revenue Contribution:** එම වියදම්, සෘජුවම ඔබගේ ආදායම ඉහළ නැංවීමට දායක වන්නේද යන්න විශ්ලේෂණය කරන්න.
- **වියදම් කපා හැරීම (Cost Reduction):** සෘජුවම ආදායම වැඩි නොකරන හෝ අනවශ්‍ය වියදම් ලැයිස්තුගත කරන්න.

    - එම වියදම් වලින් **10%-20%** කපා හැරියහොත්, ඔබේ ව්‍යාපාරයට ඇතිවන බලපෑම කුමක්ද? (මෙය ඔබේ ලාභය සහ Cash Flow වැඩි කරයි).

- මෙම විශ්ලේෂණය තුළින්, වර්ධනය සඳහා වියදම් කළමනාකරණය කිරීමට ඇති අවස්ථා හඳුනා ගන්න.

